# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1713/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 14/11/2024
පැය 1625

**මාධ්‍ය නිවේදනය**

**ව්‍යාජ දුරකථන ඇමතුම් ලබා දී ඊෂි කැෂ් ක්‍රමයට මුදල් වංචා කල සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නම සහ තනතුර භාවිතා කරමින් වෙනත් දිස්ත්‍රික් වෛද්‍යවරුන්ට සහ රෝහල් වෛද්‍යවරුන්ට දුරකථන ඇමතුම් ලබා දී එම වෛද්‍යවරුන් රැවටීමට ලක් කර සම්බන්ධව 2024.11.07 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිඝනක අපරාධ විමර්ශන අංශය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. තවද, ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් යැයි පවසා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ අධිකාරීවරුන් වෙත දුරකථන ඇමතුම් ලබා දී ඔවුන් රවටා මුදල් වංචා කිරීමක් සම්බන්ධව 2024.10.30 වන දින එහි සාමාන්‍යාධිකාරීවරයා විසින්ද, පරිගණක අපරාධ විමර්ශන අංශය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

එම පැමිණිලි වලට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ලෙස පෙනී සිටිමින් ඔහුගේ දියණිය සමඟ මෝටර් රථයෙන් ගමන් කරමින් සිටියදි කාර්මික දෝෂයකට ලක්ව ඇති බවත්, එම දෝෂය සකස් කර ගැනීම සඳහා වෛද්‍යවරුන් වෙත දුරකථන ඇමතුම් ලබා දෙමින් එය අලුත්වැඩියා කිරීම සඳහා වැයවන මුදල් ප්‍රමාණය එම අවස්ථාවේදී නොමැති බැවින් හැකි ඉක්මනින් ඊෂි කැෂ් ක්‍රමයට මුදල් යොමු කරන ලෙසට දන්වා දුරකථන අංකයක් ලබා දී මුදල් බැර කරවාගෙන එම මුදල නැවත ලබා දෙන බවට විශ්වාසය ඇති වන පරිදි කථා කර රැවටීමට ලක්කර මෙම මුදල් වංචා කර ඇති බවට අනාවරණය වී ඇත. තවද, මෙවැනි ආකාරයටම ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයා බවට සඳහන් කරමින් මෝටර් රථය කාර්මික දෝෂයකට ලක්ව ඇති සඳහන් කරමින් එය අලුත්වැඩියා කර ගැනීමට ඩිපෝ අධිකාරීවරුන් වෙතද දුරකථන ඇමතුම් ලබා දී ඊෂි කැෂ් ක්‍රමයට මුදල් වංචා කර ඇති බවටත් අනාවරණය වී ඇත.

ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන අංශය මගින් අදාල පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන සිදු කර ඇති අතර, මෙම මුදල් වංචාවන් සඳහා භාවිතා කරන ලද දුරකථන අංක වලස්මුල්ල ප්‍රදේශයේ සිට ක්‍රියාත්මක වන බවට අනාවරණය කර ගෙන ඇත. එහිදී මෙලෙස පුද්ගලයින් රැවටීමට ලක් කර වංචනිකව ලබා ගන්නා මුදල් ලබා ගැනීමට බෙලිඅත්ත ප්‍රදේශයේ පුද්ගලික බැංකුවක ඒ.ටී.එම්. යන්ත්‍රය වෙත පැමිණි පුද්ගලයෙකු 2024.11.13 වන දින වලස්මුල්ල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ වලස්මුල්ල ප්‍රදේශයේ තාවකාලික පදිංචි වී සිටි පුද්ගලයෙකි.**

එම සැකකරුගෙන් සිදු කරන ලද ප්‍රශ්න කිරීමේදී ඒ.ටී.එම්. යන්ත්‍රය මගින් ලබා ගන්නා මුදල් තවත් අයෙකුගේ දැනුම් දීම මත අදාල පුද්ගලයා පවසන ස්ථානයට ගොස් භාරදීමට කටයුතු කරන බවත්, ඒ වෙනුවෙන් සැකකරුට අයිස් මත්ද්‍රව්‍ය පැකට්ටුවක් ලබා දෙන බවටත් අනාවරණය වී ඇත. එම තොරතුර අනුව මෙම වංචාව සිදුකළ ප්‍රධාන සැකකරු 2024.11.13 වන දින තෝරකොළයාය ප්‍රදේශයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරු වයස අවුරුදු 28 ක් වූ තෝරකොළයාය, මුල්ඇඩියාවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙලෙස දුරකථන ඇමතුම් ලබාදී පුද්ගලයින් රැවටීමට ලක් කර ඊ්‍ෂි කැෂ් ක්‍රමයට මුදල් යොමු කර ගැනීමට භාවිතා කළ සිම්පත ප්‍රධාන සැකකරු සන්තකයේද, එම සිම්පත යෙදීමට භාවිතා කළ ජංගම දුරකථනය පළමු සැකකරු සන්තකයේද තිබියදී විමර්ශන නිලධාරීන් විසින් සොයා ගෙන ඇත. ඉහත අපරාධයන් දෙකම මෙම සැකකරුවන් විසින් සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනවලදී අනාවරණය වී ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

මෙම ආකාරයට දුරකථන ඇමතුම් ලබාදී පුද්ගලින් රවටා ඊ්‍ෂි කැෂ් ක්‍රමයට වංචනික ලෙස මුදල් ලබා ගන්නා පුද්ගලයින්ට හසු නොවන ලෙසටත් එවැනි සිද්ධීන් හෝ සැකකරුවන් සම්බන්ධයෙන් යම් තොරතුරක් වෙතොත් වහාම පොලිසියට දැනුම් දෙන ලෙසට මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**